(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 101.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2011 ජූලි මස 05 වැනි අඟහරුවාදා අ. භා. 1.00 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0285/'10

1\.

ගරු රවී කරුණානායක මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ජල සම්පාදන සහ ජලාපවහන අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන සහ රාජ්‍ය සංස්ථා කවරේද;

(ii) ඉහත කී අමාත්‍යාංශයේ සමස්ත මාසික සහ වාර්ෂික පිරිවැය කොපමණද;

(iii) ස්ථිර කාර්ය මණ්ඩල සේවක සංඛ්‍යාව සහ ඔවුන්ට මාසිකව ගෙවනු ලබන සමස්ත වැටුප් සහ දීමනා ප්‍රමාණය කොපමණද; සහ

(iv) ජල සම්පාදන සහ ජලාපවහන අමාත්‍යතුමාගේ, නියෝජ්‍ය අමාත්‍යතුමාගේ සහ එම කාර්ය මණ්ඩලවල සමස්ත මාසික පිරිවැය කොපමණද;

යන්න 2010 සහ 2011 වර්ෂවලට අදාළව වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0717/'10

2\.

ගරු දයාසිරි ජයසේකර මහතා,— සිවිල් ගුවන්සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) වර්ෂ 1994 සිට මේ දක්වා කටුනායක ගුවන්තොටුපලේ තිබෙන තීරුබදු රහිත වෙළෙඳසැල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් තීරුබදු රහිත වෙළෙඳසැල් ලබා දී ඇති හෝ බදු දී ඇති පුද්ගලයන්ගේ නම් සහ ලිපිනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම සාප්පු සංකීර්ණ ලබා දී ඇති මුළු මුදල හෝ ස්ථිර වශයෙන් පවරා දීමට රජය ලබා ගත් මුදල් ප්‍රමාණය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කටුනායක ගුවන්තොටුපල තුළ නව සාප්පු සංකීර්ණයක් ඉදි කිරීම සඳහා කටයුතු යොදා තිබේද;

(ii) එසේ නම්, එය ආරම්භ කරන දිනය කවරේද;

(iii) ඒ යටතේ ඉදිකිරීමට අපේක්ෂිත වෙළෙඳසැල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1047/'10

3\.

ගරු මොහමඩ් අස්ලම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) දිවයිනේ විවිධ පළාත්වල සේවය කරන ස්වේච්ඡා ගුරුවරුන්, ගුරු සහායකවරුන් ලෙස පත්කිරීම සම්බන්ධයෙන් 2006.10.25 දින අමාත්‍ය මණ්ඩලය එළැඹි තීන්දුවකට අනුව සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක ED/2/20/4/1/47උප හා 2007.02.10 දිනැති උපදෙස් අනුව, මධ්‍යම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් අයදුම්පත් කැඳවන ලද බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඒ අනුව මධ්‍යම පළාත තුළ ගුරු සහායක තනතුර සඳහා අයදුම්කළ සංඛ්‍යාව කොපමණද;

(ii) සම්මුඛ පරීක්‍ෂණයෙන් එම තනතුර සඳහා සුදුසුකම්ලත් පුද්ගලයින්ගේ සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iv) ඔවුන් අතරින් මේ වන විටත් ඉහත පත්වීම් ලද පුද්ගලයින්ගේ සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ ලිපිනයන් මහනුවර, මාතලේ සහ නුවරඑළිය යන දිස්ත්‍රික්කවලට අයත් අධ්‍යාපන කලාප මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1144/'11

4\.

ගරු අජිත් කුමාර මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වර්ෂ 2005 සිට 2010 දක්වා කාල සීමාවේදී රැකියා සඳහා විදේශගත වූ ශ්‍රී ලාංකිකයන් අතරින්,

(i) තුවාල ලැබූ (විවිධ අනතුරුවලට භාජනය වූ) සංඛ්‍යාව;

(ii) රැකියා අහිමිව ආපසු පැමිණි සංඛ්‍යාව;

(iii) සුභ සාධක මධ්‍යස්ථානවල සිටින සංඛ්‍යාව;

(iv) වර්ෂ 2005 දී මියගිය සංඛ්‍යාව;

කවරේද යන්න, වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) කොටසෙහි සඳහන් පීඩාවන්ට පත්වූවන් සඳහා රජය කිසියම් සහන වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළේද;

(ii) එසේ නම්, ඔවුන් වෙනුවෙන් දුන් සහන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1163/'11

5\.

ගරු අනුර දිසානායක මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 දී දුම්රිය දෙපාර්තමේන්තුව විසින් ගිනි නිවන උපකරණ මිලදී ගැනීමක් කර තිබේද;

(ii) එසේ නම්, මිලදී ගත් ගිනි නිවන උපකරණ සංඛ්‍යාව කොපමණද;

(iii) ඒ සඳහා වැය කළ මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) දුම්රිය මැදිරි සඳහා සවි කිරීමට ඉහත පරිදි මිලදී ගත් ගිනි නිවීමේ උපකරණ කල් ඉකුත් වූ ඒවා බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එවැනි තත්ත්වයක් ඇතිවීමට වගකිව යුතු නිලධාරීන්ට අදාළව පරීක්ෂණයක් කර තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1177/'11

6\.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) එක්සත් ජාතීන්ගේ නේවාසික සම්බන්ධීකරණ කාර්යාලයේ සහයෝගය ඇතිව, නීති පීඨය සහ මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය විසින් 2010 දෙසැම්බර් 10 දින කොළඹ විශ්වවිද්‍යාලයෙහි සංවිධානය කළ උත්සවයකදී 1998 දී එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් සම්මානලාභියෙකු වන සුනිලා අබේසේකර මහත්මියට කතාකිරීමට අවසර ලබා නොදුන් බවත්;

(ii) සුනිලා අබේසේකර මහත්මියට කතාකිරීමට අවසරදීම ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය එම උත්සවය අවලංගු කළ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත කී උත්සවයේදී සුනිලා අබේසේකර මහත්මියට කථාකිරීමට ඉඩ නොදීමට හේතු කවරේද;

(ii) විශ්වවිද්‍යාලයක කථාකිරීමට හැක්කේ කාටද යන්න නිශ්චය කිරීම සඳහා ප්‍රතිපත්තියක් තිබේද;

(iii) එසේ නම්, එම ප්‍රතිපත්තිය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) සිතීමේ නිදහස සහ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස අවශ්‍ය කරන්නා වූ විශ්ව මට්ටමේ ඉගෙනුම හා දැනුම විශ්වවිද්‍යාල තුළ ප්‍රවර්ධනය කරන්නේ කෙසේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0656/'10

7\.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රටෙහි තිබෙන විශාලතම රජයේ දෙපාර්තමේන්තු දහය කවරේද;

(ii) ඒවා විශාලතම දෙපාර්තමේන්තු දහය අතරට ගැනෙන ලෙස සලකන්නේ කෙසේද;

(iii) එම එක් එක් ආයතනයට යොදවා ඇති ප්‍රාග්ධන ප්‍රමාණය සහ ඒවායේ දැනට සිටින සේවක සංඛ්‍යාව කවරේද;

(iv) මෙම එක් එක් දෙපාර්තමේන්තුව අද දක්වා වූ පසුගිය වර්ෂ පහක කාලය තුළ ලැබූ ලාභය හෝ පාඩුව වාර්ෂික පදනමින් කොපමණද; සහ

(v) එම එක් එක් දෙපාර්තමේන්තුවේ වෙළෙඳපොළ කොටස කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත දෙපාර්තමේන්තු අතරින් පාඩු ලබන ආයතන ලාභ ලබන ආයතන බවට පත් කළ හැකිද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0732/'10

8.

ගරු දයාසිරි ජයසේකර මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2006 සිට මේ දක්වා විදේශයන්හිදී මිය ගිය විදේශගත ශ්‍රමිකයන් සංඛ්‍යාව එක් එක් මාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම මරණවලට හේතු කවරේද;

(iii) එසේ මිය ගිය අයගෙන් ශ්‍රී ලංකාවට ගෙන්වා ගත් මෘත දේහ සංඛ්‍යාව කොපමණද;

(iv) මෘත දේහ ගෙන්වා ගැනීමට නොහැකි වූයේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත මිය ගිය අය වෙනුවෙන් මෙතෙක් වන්දි ලබා දී ඇති අවස්ථා සංඛ්‍යාව කොපමණද;

(ii) මිය ගිය අය වෙනුවෙන් වන්දි ලබා නොදුන් අවස්ථා වේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1048/'10

9.

ගරු මොහමඩ් අස්ලම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ස්වේච්ඡා ගුරුවරුන්, ගුරු සහායකවරුන් ලෙස පත්කිරීමට අදාළ 2006.10.25 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක ED/2/20/4/1/47 උප දරන 2007.02.10 දිනැති ලිපිය මගින් නිකුත් කරන ලද උපදෙස් අනුව, මධ්‍යම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් කළ අයදුම්පත් කැඳවීම පරිදි මාතලේ දිස්ත්‍රික්කයේ නාඋල, විල්ගමුව, ගලේවෙල හා මාතලේ යන අධ්‍යාපන කලාපවලින් ඉදිරිපත් වූ අපේක්ෂකයින් අතරින් 31 දෙනෙකු සම්මුඛ පරීක්ෂණයේදී එම තනතුර සඳහා සුදුසුකම් ලද බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අංක ED/2/29/4/1/47 List හා 2008.09.08 දිනැති ලිපිය මගින් ඔවුන්ට ගුරු සහායක පත්වීම් පිරිනමන ලෙසට මධ්‍යම පළාත් අධ්‍යාපන ලේකම් වෙත නියෝග කර ඇති බවත්;

(ii) මෙතෙක් එම පත්වීම් ලබාදීම වෙනුවට 2010.02.10 දින ගුරු පුහුණුව සඳහා නියමිත මධ්‍යස්ථාන සඳහා අනුයුක්ත කරමින් අධ්‍යාපන ලේකම් විසින් අංක ED/1/20/6/24 යටතේ ලිපි යැවීම පමණක් සිදුකර ඇති බවත්;

(iii) එම තත්ත්වය නිසා ගුරු සහායක පත්වීම් ලැබීමට නියමිත ඉහත පිරිස තවදුරටත් අසරණභාවයට පත්වී සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) එසේ නම්, ඔවුන්ට ගුරු සහායක පත්වීම් ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1149/'11

10.

ගරු අජිත් කුමාර මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වර්ෂ 2005 සිට 2010 දක්වා කාල සීමාවේදී විදේශ රැකියා නියෝජිත ආයතනයක් ලියාපදිංචි කිරීම සඳහා රජය අය කරන ලද ගාස්තුව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) විවිධ අක්‍රමිකතා සඳහා යොමු වී ඇති විදේශ රැකියා නියෝජිත ආයතන තිබේද;

(ii) ඒවා නීතිය හමුවට ගෙනැවිත් තිබේද;

(iii) එවැනි ආයතන සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1164/'11

11.

ගරු අනුර දිසානායක මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2010 වර්ෂය තුළ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙහි පන්ති තහනමට ලක්වූ සිසු සංඛ්‍යාව කොපමණද;

(ii) එම සිසු/සිසුවියන්ගේ නම් සහ ඔවුන් පන්ති තහනමට ලක් කෙරුනු චෝදනා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඔවුන් අතරින් විධිමත් පරීක්ෂණයක් පවත්වා අවසන් තීරණයක් ලබා දී ඇති සිසුන් සංඛ්‍යාව කවරේද;

(iv) පන්ති තහනමට ලක්වූ අනෙකුත් සිසුන් සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0657/'10

12.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රට තුළ ඇති රජයට අයත් විශාලතම ව්‍යාපාර 30 කවරේද;

(ii) ඒවා රජය සතු විශාලතම ව්‍යාපාර 30 ලෙස සලකනු ලබන්නේ කවර පදනමකින්ද;

(iii) එක් එක් ආයතනයෙහි ආයෝජනය කරන ලද මූලධන ප්‍රමාණය හා දැනට සිටින සේවක සංඛ්‍යාව කොපමණද;

(iv) මේ දක්වා වූ පසුගිය වර්ෂ පහක කාලය තුළ එක් එක් ආයතනයෙහි ලාභ හෝ පාඩු වාර්ෂික පදනමින් කොපමණද;

(v) රජය සතු, එක් එක් ව්‍යාපාරයෙහි වෙළෙඳපොළ කොටස කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත සඳහන් ව්‍යාපාර අතරින් පාඩු ලබන සෑම ආයතනයක්ම ලාභ ලබන තත්ත්වයට පත් කළ හැකිද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0965/'10

13\.

ගරු දයාසිරි ජයසේකර මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයේදී අත්අඩංගුවට ගත් විශ්වවිද්‍යාල සිසුන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් අතරින් බන්ධනාගාර ගත කළ සිසුන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන් බන්ධනාගාරගත කිරීමට හේතු වූ වැරදි කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2010 වර්ෂයේදී පන්ති තහනමට ලක් වූ සිසුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පන්ති තහනම් කිරීම්වලට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1049/'10

14\.

ගරු මොහමඩ් අස්ලම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ස්වේච්ඡා ගුරුවරුන්, ගුරු සහායකවරුන් ලෙස පත්කිරීමට අදාළ 2006.10.25 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක ED/2/20/4/1/47 උප දරන 2007.02.10 දිනැති ලිපිය මගින් නිකුත් කරන ලද උපදෙස් අනුව, මධ්‍යම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් කළ අයදුම්පත් කැඳවීම පරිදි නුවරඑළිය දිස්ත්‍රික්කයේ වලපනේ, නුවරඑළිය, හඟුරන්කෙත, කොත්මලේ හා හැටන් යන අධ්‍යාපන කලාපවලින් ඉදිරිපත් වූ අපේක්ෂකයින් අතරින් 50 දෙනෙකු සම්මුඛ පරීක්ෂණයේදී එම තනතුර සඳහා සුදුසුකම් ලද බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අංක ED/2/29/4/1/47 List හා 2008.09.08 දිනැති ලිපිය මගින් ඔවුන්ට ගුරු සහායක පත්වීම් පිරිනමන ලෙසට මධ්‍යම පළාත් අධ්‍යාපන ලේකම් වෙත නියෝග කර ඇති බවත්;

(ii) මෙතෙක් එම පත්වීම් ලබාදීම වෙනුවට 2010.02.10 දින ගුරු පුහුණුව සඳහා නියමිත මධ්‍යස්ථාන සඳහා අනුයුක්ත කරමින් අධ්‍යාපන ලේකම් විසින් අංක ED/1/20/6/24 යටතේ ලිපි යැවීම පමණක් සිදුකර ඇති බවත්;

(iii) එම තත්ත්වය නිසා ගුරු සහායක පත්වීම් ලැබීමට නියමිත ඉහත පිරිස තවදුරටත් අසරණභාවයට පත්වී සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) එසේ නම්, ඔවුන්ට ගුරු සහායක පත්වීම් ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1169/'11

15\.

ගරු අනුර දිසානායක මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) දෙහිවල ගුවන් පාලම විවෘත කළ දිනය හා කවුරුන් විසින් විවෘත කළේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දෙහිවල ගුවන් පාලම ඉදිකිරීමෙන් සපුරාගැනීමට අපේක්ෂා කළ අරමුණු කවරේද;

(ii) දැනට එම පාලමෙන් බරවාහන ගමන් කිරීම තහනම් කර තිබේද;

(iii) එසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මේ වන විට ඉහත ගුවන් පාලම මතින් බරවාහන ධාවනය තහනම් කර ඇත්නම්, එම පාලම ඉදිකිරීමෙන් ඉටු කර ගැනීමට අපේක්ෂා කළ අරමුණු ඉටුවී නොමැති බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 1 දරන විෂය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2010.07.09 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ. භා. 1.00 සිට අ. භා. 7.30 දක්වා විය යුතු ය. අ. භා. 7.30 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— මහජන ආරක්ෂක ආඥාපනත යටතේ යෝජනාව,— 1959 අංක 8 දරන පනතින් ද, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 6 දරන පනතින් සහ 1988 අංක 28 දරන පනතින් ද සංශෝධිත (40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් ඉහත කී ආඥාපනතේ II වැනි කොටසේ විධිවිධාන 2011 ජූනි මස 30 වැනි දින සිට ශ්‍රී ලංකාව මුළුල්ලේම ක්‍රියාත්මක කරමින් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය.

*2.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 1),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2011 පෙබරවාරි 19 දිනැති අංක 1693/25 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.06.10 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 2),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2011 අප්‍රේල් 8 දිනැති අංක 1700/22 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.06.10 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 3),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2011 මැයි 02 දිනැති අංක 1704/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.06.10 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— රේගු ආඥාපනත යටතේ යෝජනාව,— (235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ 10 වැනි වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන් 2011.06.10 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(2011 මැයි 16 දිනැති අංක 1706/2 දරන අති විශේෂ ගැසට් පත්‍රය.)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝගය,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු, 1985 අංක 48 දරන පනතින් සහ 1987 අංක 28 දරන පනතින් සංශෝධිත, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 14 වැනි වගන්තිය සහ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 20 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2011 මැයි 16 දිනැති අංක 1706/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.06.10 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 103— වැඩසටහන 1,—† 2011 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2011 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන්වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබා ගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් බිලියන විස්සකට (රු. 20,000,000,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතුවන අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයේ නියමිත පරිදි වැය කළ යුතු ය.

## උපලේඛනය

| | | |
|---|---|---|
| ශීර්ෂය | 103 - | රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය |
| වැඩ සටහන | 1 - | මෙහෙයුම් වැඩසටහන |
| ව්‍යාපෘතිය | 2 - | අමාත්‍යාංශ පරිපාලනය හා ආයතන සේවා |
| | | ප්‍රාග්ධන වියදම රු. 20,000,000,000 |
| | | **මුළු වියදම** රු. 20,000,000,000 |

(රුපියල් බිලියන විස්සක් පමණි.)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

† 2011 ජූනි මස 23 වැනි දින ඉදිරිපත් කරන ලද 2011 අංක 1 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න.

*8.
පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — කාරක සභාව

*9.
පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — කාරක සභාව

*10.
සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*11.
විදේශ සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*12.
විශ්‍රාම වැටුප් (ආනුෂංගික විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*13.
සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*14.
මුදල් ව්‍යාපාර පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*15.
සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2008,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2010.06.11 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතුය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*16.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2008,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2010.09.23 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතුය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*17.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමිය,— කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව 2008,— 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය අනුව 2010.12.03 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කාර්මික හා තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතුය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*18.

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා,— පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව 2008,— 1969 අංක 19 දරන පරමාණුක ශක්ති අධිකාරි පනතේ 34 වගන්තිය අනුව සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය අනුව 2010.06.30 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතුය.

(විදුලිබල හා බලශක්ති කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*19.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ නියෝග,— 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 5 ආ සහ 5 ඇ වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 25 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාදන ලද සහ වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් අනුමත කරන ලදුව 2010 ඔක්තෝබර් මස 27 දිනැති, අංක 1677/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.01.04 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*20.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*21.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය,— (52 වැනි අධිකාරිය වූ) සුරාබදු ආඥාපනතේ 25 වැනි වගන්තිය යටතේ, සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ අනුමතිය ලත් හෝටල් තුළ මධ්‍යසාර භාවිතය සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 ජනවාරි 21 දිනැති අංක 1689/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත්කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 935 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*22.
අධිකරණ අමාත්‍යතුමා,— ණය සහනදායක ආඥාපනත යටතේ නියෝග,— (81 වැනි අධිකාරය වූ) ණය සහනදායක ආඥාපනතේ 63 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී ආඥාපනතේ 6 සහ 10 වැනි වගන්ති යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදනු ලදුව, 2011 ජනවාරි 21 දිනැති අංක 1689/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබ, 2011.06.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

0199/'10

1.
ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනතට අනුව ආරම්භයේ දී කොමිෂන් සභාව සතු වූ මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතුරින් මේ වන විට විකුණා ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එයින් අක්කර 5 ට වැඩි විකුණුම්වල ඉඩමේ නම, ප්‍රමාණය, විකුණූ දිනය, ගැනුම්කරු සහ විකුණූ මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉතිරි ඉඩම්වලින් කිසිවක් දීර්ඝකාලීන බදු පදනම යටතේ ලබා දී තිබේද;

(ii) එසේ නම්, ලබාදුන් ඉඩමේ නම, බදු ගැනුම්කරු හා ලබාදුන් දිනය, ලබාගත් බදු මුදල සහ බදු අවසන් වන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) එසේ නොවිකුණා හෝ බදු නොදී ඉතිරිව ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒවා ග්‍රාම නිලධාරී වසම් අනුව අක්කර වශයෙන් කොපමණද;

(iii) එම ඉඩම් පිහිටි ස්ථාන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0200/'10

2.
ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මහියංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනතට අනුව ආරම්භයේ දී කොමිෂන් සභාව සතු වූ මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතුරින් මේ වන විට විකුණා ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එයින් අක්කර 5 ට වැඩි විකුණුම්වල ඉඩමේ නම, ප්‍රමාණය, විකුණූ දිනය, ගැනුම්කරු සහ විකුණූ මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉතිරි ඉඩම්වලින් කිසිවක් දීර්ඝකාලීන බදු පදනම යටතේ ලබා දී තිබේද;

(ii) එසේ නම්, ලබාදුන් ඉඩමේ නම, බදු ගැනුම්කරු හා ලබාදුන් දිනය, ලබාගත් බදු මුදල සහ බදු අවසන් වන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) එසේ නොවිකුණා හෝ බදු නොදී ඉතිරිව ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒවා ග්‍රාම නිලධාරී වසම් අනුව අක්කර වශයෙන් කොපමණද;

(iii) එම ඉඩම් පිහිටි ස්ථාන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0201/'10

3.

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) කන්දකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනතට අනුව ආරම්භයේ දී කොමිෂන් සභාව සතු වූ මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතුරින් මේ වන විට විකුණා ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එයින් අක්කර 5 ට වැඩි විකුණුම්වල ඉඩමේ නම, ප්‍රමාණය, විකුණූ දිනය, ගැනුම්කරු සහ විකුණූ මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉතිරි ඉඩම්වලින් කිසිවක් දීර්ඝකාලීන බදු පදනම යටතේ ලබා දී තිබේද;

(ii) එසේ නම්, ලබාදුන් ඉඩමේ නම, බදු ගැනුම්කරු හා ලබාදුන් දිනය, ලබාගත් බදු මුදල සහ බදු අවසන් වන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) එසේ නොවිකුණා හෝ බදු නොදී ඉතිරිව ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒවා ග්‍රාම නිලධාරී වසම් අනුව අක්කර වශයෙන් කොපමණද;

(iii) එම ඉඩම් පිහිටි ස්ථාන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0202/'10

4.

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මීගහකිවුල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනතට අනුව ආරම්භයේ දී කොමිෂන් සභාව සතු වූ මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතුරින් මේ වන විට විකුණා ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එයින් අක්කර 5 ට වැඩි විකුණුම්වල ඉඩමේ නම, ප්‍රමාණය, විකුණූ දිනය, ගැනුම්කරු සහ විකුණූ මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉතිරි ඉඩම්වලින් කිසිවක් දීර්ඝකාලීන බදු පදනම යටතේ ලබා දී තිබේද;

(ii) එසේ නම්, ලබාදුන් ඉඩමේ නම, බදු ගැනුම්කරු හා ලබාදුන් දිනය, ලබාගත් බදු මුදල සහ බදු අවසන් වන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) එසේ නොවිකුණා හෝ බදු නොදී ඉතිරිව ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒවා ග්‍රාම නිලධාරී වසම් අනුව අක්කර වශයෙන් කොපමණද;

(iii) එම ඉඩම් පිහිටි ස්ථාන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0203/'10

5.

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) සොරණාතොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනතට අනුව ආරම්භයේ දී කොමිෂන් සභාව සතු වූ මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතුරින් මේ වන විට විකුණා ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එයින් අක්කර 5 ට වැඩි විකුණුම්වල ඉඩමේ නම, ප්‍රමාණය, විකුණූ දිනය, ගැනුම්කරු සහ විකුණූ මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉතිරි ඉඩම්වලින් කිසිවක් දීර්ඝකාලීන බදු පදනම යටතේ ලබා දී තිබේද;

(ii) එසේ නම්, ලබාදුන් ඉඩමේ නම, බදු ගැනුම්කරු හා ලබාදුන් දිනය, ලබාගත් බදු මුදල සහ බදු අවසන් වන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) එසේ නොවිකුණා හෝ බදු නොදී ඉතිරිව ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒවා ග්‍රාම නිලධාරී වසම් අනුව අක්කර වශයෙන් කොපමණද;

(iii) එම ඉඩම් පිහිටි ස්ථාන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0204/'10

6.

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනතට අනුව ආරම්භයේ දී කොමිෂන් සභාව සතු වූ මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතුරින් මේ වන විට විකුණා ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එයින් අක්කර 5 ට වැඩි විකුණුම්වල ඉඩමේ නම, ප්‍රමාණය, විකුණූ දිනය, ගැනුම්කරු සහ විකුණූ මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉතිරි ඉඩම්වලින් කිසිවක් දීර්ඝකාලීන බදු පදනම යටතේ ලබා දී තිබේද;

(ii) එසේ නම්, ලබාදුන් ඉඩමේ නම, බදු ගැනුම්කරු හා ලබාදුන් දිනය, ලබාගත් බදු මුදල සහ බදු අවසන් වන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) එසේ නොවිකුණා හෝ බදු නොදී ඉතිරිව ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒවා ග්‍රාම නිලධාරී වසම් අනුව අක්කර වශයෙන් කොපමණද;

(iii) එම ඉඩම් පිහිටි ස්ථාන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?